**ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය - සංරචකය I - 2021**

ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය - සංරචකය I හි 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව අතර 2019 ජනවාරි 23 දිනැතිව එළඹි අංක. 8878-එල්කේ දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ණය ගිවිසුම අනුව, එවකට සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය, වර්තමානයේ සෞඛ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතියේ විධායක නියෝජිතායතනය වන අතර එවකට පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශය වර්තමානයේ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ සහයෝගයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් සංරචකය I සහ සංරචකය II වශයෙන් බෙදා වෙන් කර ඇති අතර සංරචකය I මධ්‍යම මට්ටමින් සහ පළාත් මට්ටමින් ක්‍රියාත්මක වේ. දිවයිනේ තෝරාගත් ප්‍රදේශවල ඉහළ අවදානම් සහිත ජන කණ්ඩායම්වල බෝ නොවන රෝග හඳුනා ගැනීම සහ කළමනාකරණය කිරීම අවධාරණය කරමින් ප්‍රාථමික සෞඛ්‍ය සේවාවල භාවිතය හා ගුණාත්මකභාවය ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 31,588 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 200 ක් වන අතර ඉන් රු. මිලියන 8,030.46 කට සමාන එක්සත් ජනපද ඩොලර් මිලියන 50.84 ක් ව්‍යාපෘතියේ සංරචකය I (මධ්‍යම මට්ටම) සඳහා වෙන් කරන ලදී. ව්‍යාපෘතියේ සම්පූර්ණ පිරිවැය ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව විසින් මූල්‍යකරණය කිරීමට එකඟ විය. ව්‍යාපෘතියේ කටයුතු 2019 ජනවාරි 23 දින ආරම්භ කර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විට එහි කටයුතු නිම කිරීමට සැලසුම් කර තිබුණි.

### 1.3 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.1 වගුවේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මේ සමඟ ඇති ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ වැය හා එහි ඒකාබද්ධ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව අධීක්ෂණය කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | මුදල රු. මිලියන | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව, 2021 දෙසැම්බර් 31 දිනට සංරචකය I සඳහා අරමුදල් නියෝජිතායතනය විසින් ගෙවා ඇති මුළු මුදල රු. මිලියන 17,359 කි. මහා භාණ්ඩාගාරය විසින් | 9,397 | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇති පරිදි, සංරචකය I සඳහා මහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 7,785ක් ලැබී ඇති අතර එය නිවැරදි බවත්, ලැබුණු මුදල සහ නිකුත් කළ | ව්‍යාපෘතිය සඳහා ලැබුණු සියලුම අරමුදල් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු අතර වෙනසට හේතු හඳුනාගෙන හෙළිදරව් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | එයින් රු. මිලියන 7,962 ක මුදලක් පමණක් ව්‍යාපෘතියේ සංරචකය I සඳහා නිකුත් කරන ලදී. කෙසේ වුවද, මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සංරචකය I සඳහා භාණ්ඩාගාරයෙන් ලැබී ඇති මුදල රු. මිලියන 7,785ක් පමණක් වන අතර රු. මිලියන 177ක වෙනසට හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද, මූල්‍ය ප්‍රකාශනවලට අනුව, පසුගිය වසර තුන තුළ ව්‍යාපෘතියේ සංරචකය I සඳහා වැය කර ඇති මුළු මුදල රු. මිලියන 7,733 කි. මහා භාණ්ඩාගාරයේ ඉතිරිව ඇති රු.මිලියන 9,397 ක ශේෂය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | | මුදල අතර වෙනසක් ඇති බවත්, සවිස්තරාත්මක තොරතුරු සොයාගත් වහාම තොරතුරු ඉදිරිපත් කරන බවත් දැනුම් දෙමි. | |
| (ආ) | HPV/DNA පරීක්ෂණ කට්ටල 15,000 ක් සඳහා වැය කරන ලද රු. මිලියන 45.45ක පුනරාවර්තන වියදම සහ කෙටි දුරකථන පණිවිඩ සේවාව ලබා ගැනීම සඳහා ගෙවන ලද රු. 540,000 ක වාර්ෂික සම්බන්ධතා ගාස්තුව ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ දී රු. මිලියන 2.21 කට මිලදී ගත් ජංගම නොවන වත්කම් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 48.20 | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අවශ්‍ය ගැළපීම් සිදු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබේ. | වියදම් හඳුනා ගැනීමට, වර්ගීකරණය කිරීමට සහ ගිණුම්ගත කිරීමට නිසි පරිදි කටයුතු කළ යුතුය. |
| (ඇ) | මුදල් ලදුපත්, බිල්පත්, ගෙවීම් පිළිබඳ විස්තර, ටෙන්ඩර් ලේඛන සහ භාණ්ඩ ලැබීම් පත්‍රය වැනි ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු. මිලියන 63.67 ක් වූ වියදම සතුටුදායක අන්දමින් තහවුරු කිරීමට නොහැකි වී තිබුණි. | 63.67 | මෙම වවුචර 68 රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවලට සිදු කරන ලද ගෙවීම්වලට අදාළ වන අතර එම ආයතනවලින් ලදුපත් ඉල්ලා ඇති අතර එම ලදුපත් ලැබුණු වහාම ඒවා ඉදිරිපත් කරමි. | විගණනය සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | සබරගමුව පළාතේ ගොඩනැගිලි නඩත්තුව, කාර්යාලීය උපකරණ මිලදී ගැනීම සහ කොවිඩ්-19 වැළැක්වීම සඳහා වැය කළ රු.මිලියන 4.65ක මුදලක් ධාරිතා සංවර්ධන වියදම් වශයෙන් සාවද්‍ය ලෙස ගිණුම්ගත කර තිබුණි. | 4.65 | 2021 අවසාන ගිණුම්වල ධාරිතා ගොඩනැගීමේ සංරචකය යටතේ එම මුදල සාවද්‍ය ලෙස වාර්තා කර ඇති අතර 2022 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ජර්නල් සටහන් මගින් එය නිවැරදි කරනු ලැබේ. | වියදම් හඳුනා ගැනීමට, වර්ගීකරණය කිරීමට සහ ගිණුම්ගත කිරීමට නිසි පරිදි කටයුතු කළ යුතුය. |

## 2.2 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 20 (1) සහ 20 (2) වගන්ති. | විධිමත් බදු ඉන්වොයිසියක් ලබා ගැනීමකින් තොරව, සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 10 කදී රු. මිලියන 1.5 ක් වූ එකතු කළ අගය මත බදු ගෙවා ඇත. | අදාළ සමාගම සහ පුද්ගලයා විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලද බදු වාර්තාවල රු.622,195 ක් නිසි පරිදි හෙළිදරව් කර ඇති අතර ඉතිරි මුදල වූ රු. 923,932 ක් තහවුරු කරනු ලබන අතර අනාගතයේ දී අවිධිමත් ඉන්වොයිසි මත එකතු කළ අගය මත බදු ගෙවීම වැළැක්වීමට කටයුතු කරනු ලැබේ. | පනතට අනුව එකතු කළ අගය මත බදු ගෙවිය යුතුය. |
| (ආ) | 2020 මැයි 20 දින සිට බලපැවැත්වෙන 2021 අංක 09 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනතේ 8 (1) වගන්තිය | කොවිඩ් 19 වසංගතය සම්බන්ධයෙන් කටයුතු කිරීමට අවශ්‍ය අයිතම එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී. කෙසේ වුවද, එම විධිවිධානවලට පටහැනිව, 2020 මැයි 20 වැනි දිනට පසුව සිදු කරන ලද එවැනි මිලදී ගැනීම් සඳහා සැපයුම්කරුවන් 18 දෙනා වෙත එකතු කළ අගය මත බදු වශයෙන් රු. මිලියන 11 ක මුළු මුදලක් ගෙවා තිබුණි. | සංශෝධිත පනත යටතේ එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීම සම්බන්ධයෙන් නොදැනුවත්ව, එකතු කළ අගය මත බදු ගෙවා ඇති අතර, සැපයුම්කරුවන්ට ගෙවූ මුළු එකතු කළ අගය මත බදු මුදල හෙළිදරව් කර තිබුණු බව සත්‍යායනය කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කර තිබුණි. ඉදිරියේදී සැපයුම්කරුවන්ගෙන් මේ සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමට නියමිත අතර අමාත්‍යාංශය විසින් අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස අදාළ බලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. | ඒ පිළිබඳව විමර්ශනය කර වගකිවයුතු පාර්ශ්වවලින් මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 237 **(iii)** (ආ) | භාණ්ඩ ලැබීම් පත්‍රය සහ ඒවා අදාළ ඉන්වෙන්ටරි පොත්වල ඇතුළත් කර ඇති බවට සහතිකයක් ගෙවීම් වවුචර්වලට අමුණා තිබුණ ද, රු. මිලියන 3.8 ක් වූ මුළු මුදල ගෙවා තිබුණු ගෙවීම් වවුචර 02 ක් සම්බන්ධයෙන් මේ අන්දමින් කටයුතු කර නොතිබුණි. | ප්‍රමාදදෝෂයක් හේතුවෙන් එය සිදු වී ඇති අතර මින් ඉදිරියට මෙවැනි වැරදි සිදු වීම වැළැක්වීමට පියවර ගනිමි. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | සෑම මාස 02 කට වරක්ම ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්විය යුතුය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ සූම් තාක්ෂණය උපයෝගී කර ගනිමින් එක් රැස්වීමක් පමණක් පවත්වන ලදී. තවද, මෙම රැස්වීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂ ඇතුළු 52 දෙනෙකුගේ සහභාගීත්වය අපේක්ෂා කරන ලදී. එහෙත් ඊට සහභාගි වී තිබුණේ පුද්ගලයන් 08 දෙනෙකු පමණි. | සෞඛ්‍ය ලේකම්වරයාගේ සහ පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහභාගීත්වයෙන් යුක්තව මෙහෙයුම් කමිටුව පැවැත්වුණු අතර භෞතික මට්ටමින් රැස්වීම් පැවැත්වීම සීමා කර තිබීම හේතුවෙන් සාමාජිකයින් බොහෝ දෙනෙක් මාධ්‍යගතව සම්බන්ධ වූහ. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2017 ජූනි 28 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 | පළාත් කාර්යාල සහ ව්‍යාපෘති කාර්යාලය සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙළ කර නොතිබුණි. | පිළිගනිමි. ව්‍යාපෘති කාර්යාලයේ ස්ථාවර වත්කම් ලේඛනය පිළියෙළ කර පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 වන දිනට වියපැහැදම් කිරීමේ සබැඳි දර්ශක 06ක් සම්බන්ධයෙන් අපේක්ෂිත භෞතික ප්‍රගතියෙන් සියයට 59ක් පමණක් සාක්ෂාත් කරගෙන තිබුණි. එබැවින්, ව්‍යාපෘති කාල සීමාව තුළ ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම දුෂ්කර වන බව නිරීක්ෂණය විය. | මූලික ගිවිසුමට අනුව, වෛද්‍ය සැපයුම් තොරතුරු කළමනාකරණ පද්ධතිය ප්‍රාථමික සත්කාර ආයතන 350ක් දක්වා ව්‍යාප්ත කිරීමට නියමිතව තිබූ නමුත් එම පද්ධතියේ පැවති තාක්ෂණික ගැටලු හේතුවෙන් එම පද්ධතිය ආයතන 62කට පමණක් ව්‍යාප්ත කිරීමට හැකි විය. 2021 ජනවාරි මාසයේදී සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අමාත්‍යාංශයේ සැලසුම් අංශය මගින් ලැබුණු ප්‍රමුඛතා මත පදනම්ව තෝරාගත් ක්‍රියාකාරකම් සඳහා රු.මිලියන 1236.6ක් වෙන් කර තිබුණ ද, ආනයන ක්ෂේත්‍රයේ, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සහ ඩොලරයේ පැවති ගැටලු හේතුවෙන් ඒවා ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.2 පද්ධති සහ පාලන

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන මූල්‍ය වර්ෂය අවසන් වී මාස දෙකක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, 2021 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මාස 05ක ප්‍රමාදයකින් පසුව, 2022 අගෝස්තු 09 | ඉදිරියේදී නියමිත දිනට හෝ ඊට පෙර මූල්‍ය ප්‍රකාශන ලබා දෙන ලෙස අදාළ නිලධාරීන්ට දන්වා ඇති බව. | නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වැනි දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. | | |
| (ආ) | 2021 වර්ෂයේ අවස්ථා 36කදී ජාතික පිළිකා මර්දන වැඩසටහන මගින් ගෙවන ලද රු. මිලියන 41.8ක මුදලට අදාළ ප්‍රසම්පාදන කමිටු තීරණ වගකිවයුතු නිලධාරියෙකු විසින් අනුමත කර නොතිබුණි. | ප්‍රසම්පාදන කමිටු තීරණ සඳහා බලයලත් නිලධාරියෙකුගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව. | අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ප්‍රසම්පාදන කමිටුවේ තීරණ ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතියේ සංරචකය I (මධ්‍යම මට්ටම) සඳහා නිසි වැය විෂයයක් යටතේ මූල්‍ය ප්‍රතිපාදන සලසා නොතිබියදී, සමාලෝචිත වර්ෂය තුළ එම වත්කම් මිලදීගෙන තිබීම හේතුවෙන්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනයේ රු. මිලියන 473 ක් වටිනා ජංගම නොවන වත්කම් හඳුනාගෙන නොතිබුණි. | ඉන්වෙන්ටරි එම ගෙවීම් ඒකක මගින්ම සිදු කර ඇති අතර විගණකාධිපති වාර්තාවේ සඳහන් මුදල සඳහා තහවුරු කිරීම් ලබා ගන්නා ලෙස ද, එම මුදල CIGAS ගිණුම්කරණ පද්ධතියේ ආරම්භක ශේෂය ලෙස සලකන ලෙස ද අදාළ නිලධාරීන්ට දැනුම් දෙනු ලබන බව. | මූල්‍ය නොවන වත්කම් නිසි පරිදි ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | මධ්‍යම පළාතේ රෝහල් 47 ක සහ ආයතනවල ඉදිකිරීම් ව්‍යාපෘති 66 ක් සඳහා වැය කරන ලද රු. මිලියන 173 ක මුදලක් මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රාථමික සෞඛ්‍ය සේවා ආයතන ලෙස හඳුනාගෙන නොතිබුණි. | රටේ සෞඛ්‍ය පද්ධතිය පර්යන්ත මට්ටමේ සිට මධ්‍යම මට්ටම දක්වා සේවා ජාලයක් ලෙස සංවිධානය වී ඇත්තේ පුරවැසියන්ට වඩා හොඳ සෞඛ්‍ය සේවාවක් සැපයීම සඳහා වන අතර, සත්‍ය වශයෙන්ම, බොහෝ උසස් ප්‍රතිකාර සහ පහසුකම් පර්යන්ත මට්ටමේදී ලබා ගත නොහැකිය. එබැවින්, සෞඛ්‍ය පද්ධතියේ සියලුම රෝහල්වල ධාරිතාව ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වන අතර දිවයිනේ රෝහල් 1000කට වැඩි සංඛ්‍යාවක් අතරින් ලෝක බැංකු අරමුදල් සහතික කිරීම සඳහා ප්‍රතිඵල සත්‍යාපනය කිරීමට හඳුනාගෙන ඇත්තේ රෝහල් 550ක් පමණි. | ව්‍යාපෘතිය මගින් සැලසුම් කළ කාර්යයන් සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතුය. |
| (ඉ) | ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ බෝ නොවන රෝග හඳුනාගෙන කළමනාකරණය කිරීම වුවද, වයඹ පළාතට වෙන් කර තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 50 ක් වූ රු. මිලියන 168 ක මුදලක් පළාත් සෞඛ්‍ය ආයතනවල ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වැය කර තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ තෝරාගත් ප්‍රාථමික සෞඛ්‍ය සේවා ආයතනවලට ඇතුළත් කර නොතිබුණු ගොඩනැගිලි 17ක් ඉදිකිරීම සඳහා මෙම මුදලින් රු. මිලියන 68.3ක් වැය කර තිබුණි. | ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය මගින් අරමුදල් ලැබෙන විට, පළාත් සභා මගින් ප්‍රාථමික සත්කාර සේවාවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ භාවිතය වැඩි කිරීම සඳහා ක්‍රියාකාරකම් හඳුනා ගනියි. එබැවින්, සත්‍යාපනය කළ නොහැකි රෝහල්වලින් ඇතැම් ක්‍රියාකාරකම් හඳුනා ගනු ලැබේ. | ව්‍යාපෘතිය මගින් සැලසුම් කළ කාර්යයන් සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | වයඹ පළාතේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය ඉදිකිරීමට වැය කරන ලද රු.මිලියන 31.2 ක් සහ එම කාර්යාලය සඳහා කාර්යාල උපකරණ මිලදී ගැනීමට වැය කරන ලද රු. මිලියන 2.89 ක් මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රාථමික සෞඛ්‍ය සේවා ආයතනයක් වශයෙන් හඳුනාගෙන නොතිබුණි. | ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කරන අතරම, එම පද්ධතියේ සුමට ක්‍රියාකාරීත්වය සහතික කිරීම සඳහා සෞඛ්‍ය පරිපාලන පද්ධතිය ශක්තිමත් කිරීම ද අවශ්‍ය වේ. | ව්‍යාපෘතිය මගින් සැලසුම් කළ කාර්යයන් සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතුය. |
| (උ) | මෙම ව්‍යාපෘතිය යටතේ ලැයිස්තුගත කර ඇති උපකරණ හැර, වෛද්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා වයඹ පළාතේ පුත්තලම සහ කුරුණෑගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල මගින් රු. මිලියන 93.4 ක මුදලක් වැය කර තිබුණි. | පුරවැසියන් වෙත ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් ලබාදීමට අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට ව්‍යාපෘතියේ මුදල් යෙදවිය හැකි බව කාරුණිකව දන්වා සිටිමු. | ව්‍යාපෘතිය මගින් සැලසුම් කළ කාර්යයන් සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතුය. |
| (ඌ) | ණය ගිවිසුමේ සංශෝධිත උපලේඛන 02 අනුව, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ මගින් සංරචකය II යටතේ පුහුණු / ධාරිතා ගොඩනැගීමේ සැලසුම්වල සංවර්ධන සහ අධීක්ෂණ කොටස ක්‍රියාත්මක කළ යුතුය. කෙසේ වුවද, පළාත් 09 සඳහාම, සංරචකය I යටතේ පුහුණු / ධාරිතා ගොඩනැගීම සඳහා රු.මිලියන 112.98ක් වැය කර තිබුණි. | එකඟ වෙමි. ධාරිතා ගොඩනැගීම සංරචක II හි ක්‍රියාකාරකමක් වශයෙන් හඳුනාගෙන ඇති බව ද, සංරචක II හි ධාරිතාව වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගනිමින් ධාරිතා ගොඩනැගීමේ සැලැස්මක් පිළියෙළ කළ බව. | මෙම පිරිවැය සංරචකය II යටතේ දැරිය යුතුය. |